## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- චිත්‍ර **අදාළ සතිය** :- ජනවාරි 1 වන සතිය

**2.පාඩම/ ඒකකය:-**.1.1.1 අඳුරු රැයක පුද බිමක අසිරිය

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- ඔබ රාත්‍රී කාලයේ සහභාගි වූ ආගමික අවස්ථාවක් සිහියට නගා ගන්න
- තම මතකයේ ඇති අවස්ථාවක් මතකයට නගා ගැනීම තුලින්,හැඩතල භාවිතයේ දී හා පසුබිම ගොඩනැගීමේ දී ගැටලු ඇතිවි ම අවම වේ.
- ඉහත මාතෘකාව අනුව, තම නිදහස් රේඛාව භාවිතා කරමින් තරමක් විශාල හැඩතල යොදා තලය (කඩදාසි මතුපිට )පිරෙන්න ප්‍රකාශන චිත්‍රයක් ගොඩ නගන්න.
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ඉහත මාතෘකාවට අදාල ඡායාරූප අධ්‍යයනය කරන්න,නමුත් එහි පිටපතක් නොවන්න.
- කාලය උපරිම පැය 02 ක් ඇතුලත නිම කිරීමට උත්සාහ ගන්න.

5.අවශ්‍ය ද්‍රව්‍ය

- චිත්‍ර ඇදීමට සුදුසු A4 ප්‍රමානයේ කඩදාසියක් (කඩදාසියේ උස පැත්තට හෝ දිග පැත්තට)
- සුදුසු වර්ණ මාධ්‍යයක්.(පැස්ටල්,දියසායම)

6.ඇගයීම

- ගැලපෙන ලෙස තලය භාවිතය
- ත්‍රිමාන ලක්ෂණ, පරිමාණය අනුව හැඩතල භාවිතය.
- ගැලපීම හා ත්‍රිමාන ලක්ෂණ අනුව වර්ණ භාවිතය.
- සමස්ත නිමාව.

**4. ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත් හා ඉගෙනුම් ආධාරක :-**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය චිත්‍ර කලාව
- 11 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත චිත්‍ර කලාව
- You tube නාලිකා :-

**5 .ඉගෙනුම් ඵල :-**

- විවිධ ආගමික අවස්ථාවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- අඳුරු රැයක පුදබිමක සිද්ධි පිළිබඳ අවබෝධයෙන් කතා කරයි.
- චිත්‍ර සංරචන සිද්ධාන්ත භාවිතයෙන් මාතෘකාව චිත්‍රණය කරයි.
- විවිධ ආගමික සංස්කෘති ඇසුරින් නිර්මිත චිත්‍ර රස විඳිමින් අගයයි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය